# උක්තාඛ්‍යාත සම්බන්ධය

සිංහල ව්‍යාකරණ සම්ප්‍රදයට අනුව වාක්‍යයක් සම්පූර්ණ වීම සඳහා අවම වශයෙන් උක්තයක් හා ආඛ්‍යාතයක් තිබිය යුතු ය. ඊට අමතර ව කර්මය, නිපාත, විශේෂණ, ආඛ්‍යාත විස්තාර, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා ආදිය ද පැවැතිය හැකි ය. උක්තාඛ්‍යාත සම්බන්ධය යනු වාක්‍යයක උක්තයට අනුරූප වන අයුරින් ආඛ්‍යාතය තැබීමයි. මෙම සම්බන්ධයේ දී අදළ වාක්‍යයේ උක්තය හා ආඛ්‍යාතයට අදළ ලිංගය, පුරුෂය, වචනය ගැන සැලකිලිමත් විය යුතු ය.

උක්තාඛ්‍යාත සම්බන්ධයේ දී වාක්‍යය, කර්තෘකාරක ද කර්මකාරක ද යන්න පිළිබඳ ව ආරම්භයේ දී ම සැලකිලිමත් වීම වැදගත් ය. කර්තෘකාරක වාක්‍යයක් නම් වාක්‍යයේ කර්තෘ උක්ත වන අතර ඊට අනුරූප ව ආඛ්‍යාතය තැබිය යුතු ය. කර්මකාරක වාක්‍යයක දී කර්මය උක්ත වන අතර කර්මයට අනුරූප ව ආඛ්‍යාතය තැබීම අවශ්‍ය කෙරේ.

### කර්තෘකාරක වර්තමානකාල 'ලිය' ධාතුව

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | (හේ) ලියයි | (ඔවුහු) ලියති |
| මධ්‍යම පුරුෂ | (තෝ/ නුඹ) ලියහි | (තොපි/නුඹලා) ලියහු |
| උත්තම පුරුෂ | (මම) ලියමි | (අපි) ලියමු |

### කර්තෘකාරක අතීතකාල 'ලිය' ධාතුව

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියුවේය / ලියුවාය | ලියූහ / ලියුවෝය |
| මධ්‍යම පුරුෂ | ලියුවෙහි | ලියූවෙහු |
| උත්තම පුරුෂ | ලියුවෙමි | ලියූවෙමු |

### කර්තෘකාරක අනාගතකාල 'ලිය' ධාතුව

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියන්නේය / ලියන්නීය | ලියන්නෝය / ලියන්නාහ |
| මධ්‍යම පුරුෂ | ලියන්නෙහි | ලියන්නෙහු |
| උත්තම පුරුෂ | ලියන්නෙමි | ලියන්නෙමු |

### කර්මකාරක වර්තමානකාල ‘ලිය’ ධාතුව

| පුරුෂය | ඒකවචන | බහුවචන |
| --- | --- | --- |
| ප්‍රථම පුරුෂ | ලියනු ලැබේ/ ලියනු ලබයි | ලියනු ලැබෙත් / ලියනු ලබති |
| මධ්‍යම පුරුෂ | ලියනු ලබහි | ලියනු ලබහු |
| උත්තම පුරුෂ | ලියනු ලබමි | ලියනු ලබමි |

### කර්මකාරක අතීතකාල ‘ලිය’ ධාතුව

| පුරුෂය | ඒකවචන | බහුවචන |
| --- | --- | --- |
| ප්‍රථම පුරුෂ | ලියනු ලැබී ය / ලියනු ලැබුවා ය | ලියනු ලැබූහ / ලියනු ලැබුවෝ ය |
| මධ්‍යම පුරුෂ | ලියන ලැබූවෙහි | ලියනු ලැබූවෙහු |
| උත්තම පුරුෂ | ලියනු ලැබූවෙමි | ලියනු ලැබූවෙමු |

### කර්මකාරක අනාගතකාල ‘ලිය’ ධාතුව

| පුරුෂය | ඒකවචන | බහුවචන |
| --- | --- | --- |
| ප්‍රථම පුරුෂ | ලියනු ලබන්නේය / ලියනු ලබන්නී ය | ලියනු ලබන්නාහ / ලියනු ලබන්නෝ ය |
| මධ්‍යම පුරුෂ | ලියනු ලබන්නෙහි | ලියනු ලබන්නෙහු |
| උත්තම පුරුෂ | ලියනු ලබන්නෙමි | ලියනු ලබන්නෙමු |

## උක්තාඛ්‍යාත සම්බන්ධයට අදාළ රීති :

1. උක්තය හා ආඛ්‍යාතය ඒකවචන බහුවචන වශයෙන් සමානත්වයක් උසුලයි.

    උදා :- මිනිසා වැඩ කරයි.

    මිනිස්සු වැඩ කරති.

2. උක්තයට අයත් පුරුෂයට අදාළ ව ආඛ්‍යාතය යෙදිය යුතුය .

    උදා :- හේ පාඩම් කරයි.

    තෝ / නුඹ / ඔබ පාඩම් කරහි.

    මම පාඩම් කරමි.

3. ආඛ්‍යාතය කෘදන්තයක් වූ කල්හි උක්තය හා ලිංගයෙන් සමාන විය යුතු ය.

උදා :- පුරුෂ ලිංග : මිනිසා වැඩ කළේය, මිනිසා වැඩ කරන්නේය.

ස්ත්‍රී ලිංග : ගැහැනිය වැඩ කළාය, ගැහැනිය වැඩ කරන්නීය.

4. ස්ත්‍රීලිංගික උක්ත පදයක් සමඟ අතීතකාල ශුද්ධ ආඛ්‍යාත පදයක් යෙදෙන විට උක්තය ඒකවචන වුව ද ආඛ්‍යාතය බහුවචනයෙන් සිටී.

උදා :- මායා දේවී තුසී පුරේ වුසූ.

කතක් මහසතු සෙලින් හෙළූ.

5. සංශයාර්ථයක් ප්‍රකාශ වන වාක්‍යයක අන්තර් වාක්‍යයේ කර්තෘ අනුක්ත ව සිටී. එහි ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ බහුවචනයෙන් සිටී.

උදා :- ඔවුන් උපකාර කරති'යි අපි සිතුවෙමු.

මා ගමට එති'යි මව්පියෝ මගබලා සිටියහ.

තොප ගායනා කරති'යි ගුරුවරු සතුටු වෙති.

6. අප්‍රාණවාචී උක්තය බහුවචන වුව ද ආඛ්‍යාතය ඒකවචනයෙන් සිටී.

උදා :- ගස් වැටෙයි. මල් විකසිත වෙයි.

ගංගා ගලා බසී. තාරකා බබලයි.

7. සමුච්චයාර්ථවත් 'ද' 'ත්' යන නිපාතවලින් බැඳෙන උක්ත පද වෙන් වෙන් ව ගත් කල ඒකවචන වුව ද සමුච්චයාර්ථයෙහි බහුවචන වන හෙයින් ඒ සමඟ යෙදෙන ආඛ්‍යාතය බහුවචන විය යුතු ය.

උදා :- මව ද පුතා ද ගෙදර ගියහ.

ඔබ ද මම ද වැඩ කරමු.

මල්ලිත් මමත් පාඩම් කරමු.

ළමයාත් ඔබත් භාවනා කරහු.

නුඹත් දරුවාත් සුවසේ ජීවත් වෙහු.

8. සමූහාර්ථවාචී රළ, මුළු, ගණ, කැළ යන පද සමඟ යෙදෙන ප්‍රාණවාචී උක්තය හා බැඳෙන ආඛ්‍යාතය බහුවචනයෙන් සිටී.

උදා :- සඟ ගණ දනට වඩිති.

මීන් රළවුත් ගං වෙරළට රැස්වූ.

ගජ මුළු ගොයම් කති.

සිසු කැළ මැනැවින් උගනිත්.

9. උක්ත පද දෙකක් හෝ වැඩි ගණනක් විකල්පාර්ථ 'හෝ' නිපාතයෙන් බැඳෙන කල්හි අවසානයට යෙදෙන උක්ත පදයට අනුරූප ව ආඛ්‍යාතය යෙදිය යුතු ය.

උදා :- නුඹ හෝ අපි අසරණයාට සලකමු.

මව හෝ දරුවා ගෙදර යයි.

මම හෝ නුඹ පාඩම් කරහි.

ළමයා හෝ මම බුදුන් වඳිමි.

10. අනියමාර්ථයෙහි 'කෙනෙක්, අයෙක්, අය, ඇතැමෙක්, කවුරු, සමහරු, සමහරෙක්, දෙනෙක්, දෙන' යන පද උක්ත වූ විට ආඛ්‍යාත බහුවචන ගනී.

උදා :- කෙනෙක් වැනසෙති හැනී හුල්වල.

නටත් අයෙක් සුරා මතින්.

සියක් අය කෙරෙති වැඳ පුද පැදකුණු ය.

ඇතැමෙක් බවුන් වඩා නිවන් දකිති.

කවුරු මා ගැන දෙස් නොකියත් ද?

සමහරු දිවිතුරා බොරු නොකියති.

සමහරෙක් ඇත්ත පමණක් තෙපළති.

සදෙනෙක් මෙහි පැමිණියහ.

11. වහන්සේ, වහන්දෑ යන පද උක්ත වූ විට ආඛ්‍යාත බහුවචන ගනී.

උදා :- භික්ෂූන් වහන්සේ බණ වදරති.

මෑණියන්දෑ දරුවන් මැනැවින් රකිති.

මෑණියන්දෑ බත් උයන දෑය.

12. උක්ත වන පදය වාක්‍යය අතරතුර තවදුරටත් විස්තර කිරීමේ දී ඒ සෑම අවස්ථාවක ම උක්තවත් ව යෙදේ.

උදා :- ඔහු සිල්වතෙක් ගුණවතෙක් මෙන් ම උගතෙක් ද වෙයි.

මම භික්ෂුවක් ද ගුරුවරයෙක් ද වෙමි.

ඔවුහු ධනවත්තු ද බුද්ධිමත්හු ද වූහ.

අපි බුද්ධශ්‍රාවකයෝ වෙමු.

13. ආණ, අණු, අණි යන තද්ධිත ප්‍රත්‍ය සහිත උක්ත පද ඇති විට ආඛ්‍යාතය නිත්‍යයෙන් බහුවචන ගනී.

උදා :- ඇතාණෝ පෙරහැරේ ගමන් කරති.

මලණුවෝ කුඹුර සාති.

දියණියෝ විනයවත් ව උගනිති.

14. වාක්‍යයක උක්තය වන පදය ප්‍රථමා විභක්තියෙන් ද අන් පද අනුක්ත ව ද සිටී.

උදා :- මිනිසෙක් දරුවකු කැටුව වඳුරකු බැලීමට වනයට ගියේ ය.

සමහරෙක් සොයුරන් සමග මවක රැකීමට ඇමැතිවරයකුගේ නිවසෙහි වැඩ කරති.

ළමයි දෙමාපියන් වැඳ මිතුරන් හා පාසලට යති.

15. අප්‍රාණවාචී උක්තය 'ඕ' 'හු' යන බහුවචන ප්‍රත්‍ය ගන්නාවිට ආඛ්‍යාතය බහුවචන වේ.

උදා :- ගංගාවෝ ගලා බසිති. පියුම්හු විකසිත වෙති.

## උක්ත අනුක්ත භේදය :-

| | |
|---|---|
| මිනිසා | මිනිසා |
| මිනිස්සු | මිනිසුන් |
| අයෙක් | අයකු |
| මිනිසෙක් | මිනිසකු |
| මවක් | මවක |
| ගැහැනියක් | ගැහැනියක |
| දූරියක් | දූරියක |

| | |
|---|---|
| දරුවෙක් | දරුවකු |
| ළමයෙක් | ළමයකු / ළමයෙකු |
| පියෙක් | පියකු |
| සියල්ලෝ | සියල්ලන් |
| ඇතැමෙක් | ඇතැමකු |
| සමහරෙක් | සමහරකු |
| තෝ | තා |
| තොපි | තොප |
| නුඹ | නුඹ |
| නුඹලා | නුඹලා |
| ඔවුහු | ඔවුන් |
| බල්ලෝ | බල්ලන් |
| පූසෙක් | පූසකු |
| මම | මා |
| අපි | අප |